**ශීර්ෂය 271 - ත්‍රිකුණාමලය දිස්ත්‍රික් ලේකම් කාර්යාලය**

## 1. මූල්‍ය ප්‍රකාශන

### 1.1 තත්ත්වාගණනය කළ මතය

ශීර්ෂය 271 - ත්‍රිකුණාමලය දිස්ත්‍රික් ලේකම් කාර්යාලයේ 2022 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්වය පිළිබඳ ප්‍රකාශය, එදිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය කාර්යසාධන ප්‍රකාශය හා මුදල් ප්‍රවාහ ප්‍රකාශවලින් සමන්විත 2022 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ විධිවිධාන සමඟ සංයෝජිතව කියවිය යුතු ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(1) ව්‍යවස්ථාවේ ඇතුළත් විධිවිධාන ප්‍රකාර මාගේ විධානය යටතේ විගණනය කරන ලදී. 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 11(1) වගන්තිය ප්‍රකාරව ත්‍රිකුණාමලය දිස්ත්‍රික් ලේකම් කාර්යාලයේ මූල්‍ය ප්‍රකාශන පිළිබඳව මාගේ අදහස් දැක්වීම් හා නිරීක්ෂණයන් ඇතුළත් සම්පිණ්ඩන වාර්තාව 2023 මැයි 31 දින ගණන්දීමේ නිලධාරී වෙත නිකුත් කරන ලදී. විගණන පනතේ 11(2) වගන්තිය ප්‍රකාරව දිස්ත්‍රික් ලේකම් කාර්යාලයට අදාළ වාර්ෂික විස්තරාත්මක කළමනාකරණ විගණන වාර්තාව 2023 මැයි 30 දින ගණන්දීමේ නිලධාරී වෙත නිකුත් කරන ලදී. ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(6) ව්‍යවස්ථාව සමඟ සංයෝජිතව කියවිය යුතු 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 10 වගන්තිය ප්‍රකාරව මෙම වාර්තාව පාර්ලිමේන්තුව වෙත ඉදිරිපත් කරනු ලැබේ.

මෙම වාර්තාවේ 1.6 ඡේදයේ දක්වා ඇති කරුණුවලින් වන බලපෑම හැර, මූල්‍ය ප්‍රකාශනවලින් 2022 දෙසැම්බර් 31 දිනට ත්‍රිකුණාමලය දිස්ත්‍රික් ලේකම් කාර්යාලයේ මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මූල්‍ය කාර්යසාධනය හා මුදල් ප්‍රවාහය පොදුවේ පිළිගත් ගිණුම්කරණ මූලධර්මවලට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිබිඹු කරන බව මා දරන්නා වූ මතය වේ.

### 1.2 තත්ත්වාගණනය කළ මතය සඳහා පදනම

මෙම වාර්තාවේ 1.6 ඡේදයේ දක්වා ඇති කරුණු මත පදනම්ව මාගේ මතය තත්ත්වාගණනය කරනු ලැබේ.ශ්‍රී ලංකා විගණන ප්‍රමිතිවලට (ශ්‍රී.ලං.වි.ප්‍ර) අනුකූලව මා විගණනය සිදු කරන ලදී. මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් මාගේ වගකීම, විගණකගේ වගකීම යන වගන්තියේ තවදුරටත් විස්තර කර ඇත. මාගේ මතය සඳහා පදනමක් සැපයීම උදෙසා මා විසින් ලබා ගෙන ඇති විගණන සාක්ෂි ප්‍රමාණවත් සහ උචිත බව මාගේ විශ්වාසයයි.

### 1.3 මූල්‍ය ප්‍රකාශය සම්බන්ධයෙන් ප්‍රධාන ගණන්දීමේ නිලධාරීගේ හා ගණන්දීමේ නිලධාරීගේ වගකීම

පොදුවේ පිළිගත් ගිණුම්කරණ මූලධර්මවලට අනුකූලව හා 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 38 වගන්තියේ සඳහන් විධිවිධානවලට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිඹිබු කෙරෙන පරිදි මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරිම හා වංචා සහ වැරදි හේතුවෙන් ඇති විය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් තොරව මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකි වනු පිණිස අවශ්‍යවන අභ්‍යන්තර පාලනය තීරණය කිරීම ගණන්දීමේ නිලධාරීගේ වගකීම වේ.

2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 16(1) වගන්තිය ප්‍රකාරව දිස්ත්‍රික් ලේකම් කාර්යාලය විසින් වාර්ෂික හා කාලීන මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවන පරිදි ස්වකීය ආදායම්, වියදම්, වත්කම් හා බැරකම් පිළිබඳ නිසි පරිදි පොත්පත් හා වාර්තා පවත්වා ගෙන යා යුතුය.

ජාතික විගණන පනතේ 38(1)(ඇ) උප වගන්තිය ප්‍රකාරව දිස්ත්‍රික් ලේකම් කාර්යාලයේ මූල්‍ය පාලනය සඳහා සඵලදායි අභ්‍යන්තර පාලන පද්ධතියක් සකස් කර පවත්වා ගෙන යනු ලබන බවට ගණන්දීමේ නිලධාරී සහතික විය යුතු අතර එම පද්ධතියේ සඵලදායිත්වය පිළිබඳව කලින් කල සමාලෝචනයක් සිදු කර ඒ අනුව පද්ධතිය ඵලදායි ලෙස කරගෙන යාමට අවශ්‍ය වෙනස්කම් සිදු කරනු ලැබිය යුතුය.

## 1.4 මූල්‍ය ප්‍රකාශන විගණනය පිළිබඳ විගණකගේ වගකීම

සමස්ථයක් ලෙස මූල්‍ය ප්‍රකාශන, වංචා හා වැරදි හේතුවෙන් ඇතිවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් තොර බවට සාධාරණ තහවුරුවක් ලබාදීම සහ මාගේ මතය ඇතුළත් විගණකාධිපති වාර්තාව නිකුත් කිරීම මාගේ අරමුණ වේ. සාධාරණ සහතිකවීම උසස් මට්ටමේ සහතිකවීමක් වන නමුත්, ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනය සිදු කිරීමේදී එය සැම විටම ප්‍රමාණාත්මක සාවාද්‍ය ප්‍රකාශයන් අනාවරණය කර ගන්නා බවට වන තහවුරු කිරීමක් නොවනු ඇත. වංචා සහ වැරදි තනි හෝ සාමූහික ලෙස බලපෑම නිසා ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් ඇති විය හැකි අතර, එහි ප්‍රමාණාත්මක භාවය මෙම මූල්‍ය ප්‍රකාශන පදනම් කර ගනිමින් පරිශීලකයන් විසින් ගනු ලබන ආර්ථික තීරණ කෙරෙහි වන බලපෑම මත රඳා පවතී. ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනයේ කොටසක් ලෙස මා විසින් විගණනයේදී වෘත්තීය විනිශ්චය සහ වෘත්තීය සැකමුසු බවින් යුතුව ක්‍රියා කරන ලදී. මා විසින් තවදුරටත්,

- ප්‍රකාශ කරන ලද විගණන මතයට පදනමක් සපයා ගැනීමේදී වංචා හෝ වැරදි හේතුවෙන් මූල්‍ය ප්‍රකාශනවල ඇති විය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන් ඇතිවීමේ අවදානම් හඳුනාගැනීම හා තක්සේරු කිරීම සඳහා අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලැසුම් කර ක්‍රියාත්මක කරන ලදී. වරදවා දැක්වීම් හේතුවෙන් සිදුවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් සිදුවන බලපෑමට වඩා වංචාවකින් සිදුවන්නා වූ බලපෑම ප්‍රබල වන්නේ ඒවා දූස්සන්ධානයෙන්, ව්‍යාජ ලේඛන සැකසීමෙන්, චේතනාන්විත මඟහැරීමෙන්, වරදවා දැක්වීමෙන් හෝ අභ්‍යන්තර පාලනයන් මඟ හැරීමෙන් වැනි හේතු නිසා වන බැවිනි.

- අභ්‍යන්තර පාලනයේ සඵලදායිත්වය පිළිබඳව මතයක් ප්‍රකාශ කිරීමේ අදහසින් නොවුවද, අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලසුම් කිරීම පිණිස අභ්‍යන්තර පාලනය පිළිබඳව අවබෝධයක් ලබා ගන්නා ලදී.

- හෙළිදරව් කිරීම් ඇතුළත් මූල්‍ය ප්‍රකාශනවල ව්‍යුහය සහ අන්තර්ගතය සඳහා පාදක වූ ගනුදෙනු හා සිද්ධීන් උචිත හා සාධාරණ අයුරින් මූල්‍ය ප්‍රකාශනවල ඇතුළත් බව ඇගයීම.

- මූල්‍ය ප්‍රකාශනවල ව්‍යුහය හා අන්තර්ගතය සඳහා පාදක වූ ගනුදෙනු හා සිද්ධීන් උචිත හා සාධාරණව ඇතුළත් වී ඇති බව සහ හෙළිදරව් කිරීම් ඇතුළත් මූල්‍ය ප්‍රකාශනවල සමස්ථ ඉදිරිපත් කිරීම අගයන ලදී.

මාගේ විගණනය තුළදී හඳුනාගත් වැදගත් විගණන සොයාගැනීම්, ප්‍රධාන අභ්‍යන්තර පාලන දුර්වලතා හා අනෙකුත් කරුණු පිළිබඳව ප්‍රධාන ගණන්දීමේ නිලධාරී/ ගණන්දීමේ නිලධාරී දැනුවත් කරන ලදී.

## 1.5 වෙනත් නෛතික අවශ්‍යතා පිළිබඳ වාර්තාව

2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 6(1)(ඇ) වගන්තිය ප්‍රකාරව පහත සඳහන් කරුණු මා ප්‍රකාශ කරමි.

(අ) විගණනය වෙත ඉදිරිපත් කරන ලද මූල්‍ය ප්‍රකාශන ඉකුත් වර්ෂයේ මූල්‍ය ප්‍රකාශන සමඟ අනුරූපී වී තිබුණි.

(ආ) ඉකුත් වර්ෂයට අදාළ මූල්‍ය ප්‍රකාශන පිළිබඳ මා විසින් කර තිබුණු පහත සඳහන් නිර්දේශ ක්‍රියාත්මක කර නොතිබුණි.

| ඉකුත් වර්ෂයට අදාළ වාර්තාවේ ඡේද යොමුව | ක්‍රියාත්මක කර නොතිබුණු නිර්දේශය | මෙම වාර්තාවේ ඡේද යොමුව |
|---|---|---|
| 1.4.1.2 (අ) | වැය විෂයය නිවැරදිව හඳුනා ගෙන ගිණුම් ගත කිරීම සිදු කළ යුතුය. | 1.6.1 (අ)(i) |
| 1.4.1.3 (අ) | වැය විෂයය නිවැරදිව හඳුනා ගෙන ගිණුම් ගත කිරීම සිදු කළ යුතුය. | 1.6.1 (අ)(ii) |
| 1.4.1.3 (ආ) | වැය විෂයය නිවැරදිව හඳුනා ගෙන ගිණුම් ගත කිරීම සිදු කළ යුතුය. | 1.6.1 (ආ) |

## 1.6 මූල්‍ය ප්‍රකාශන පිළිබඳ අදහස් දැක්වීම

### 1.6.1 ගිණුම්කරණ අඩුපාඩු

(අ) පුනරාවර්තන වියදම්

මූල්‍ය ප්‍රකාශනවලට අදාළ පුනරාවර්තන වියදම් ගිණුම්ගත කිරීමේදී පහත සඳහන් අඩුපාඩු නිරීක්ෂණය විය.

| | විගණන නිරීක්ෂණය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (i) | සිවිල් ආරක්ෂක සේවාව සඳහා දිස්ත්‍රික් ලේකම් කාර්යාලය විසින් ගෙවන ලද රුපියල් 10,245,429 ක මුදලක් හා පිරිසිදු කිරීමේ සේවාව සඳහා දිස්ත්‍රික් ලේකම් කාර්යාලය විසින් ගෙවන ලද රුපියල් 353,091 ක් අනෙකුත් සේවා වැය විෂය අංක 271-1-2-0-1409 යටතේ ගිණුම්ගත නොකර | දිස්ත්‍රික් ලේකම් කාර්යාලයේ පිරිසිදු කිරීමේ වියදම් ඇස්තමේන්තු කිරීමේදී වැය විෂය 271-1-1-0-1303 යටතට ඇතුළත් කරනු ලබන අතර ප්‍රතිපාදනද එම වැය විෂයටම ලැබී ඇත. අදාල වියදම් කළ පසුව එම වැය විෂයටම ගිණුම් ගත කර | වැය ශීර්ෂ නිවැරදිව හඳුනා ගෙන ගිණුම් ගත කිරීම සිදු කළ යුතුය. |

| | | | |
|---|---|---|---|
| | පිළිවෙළින් අනෙකුත් දීමනා වැය විෂය අංක 271-1-1-0-1003 යටතේ හා ගොඩනැගිලි සහ ව්‍යුහයන් නඩත්තු කිරීමේ වැය විෂය අංක 271-1-1-0-1303 යටතේ ගිණුම්ගත කර තිබුණි. දිස්ත්‍රික් ලේකම් කාර්යාලයේ අනෙකුත් දීමනා වැය විෂයන්හි අධි වියදම් ඇති වීමේ අවදානම වැළැක්වීමේ අරමුණින් මෙලෙස ගිණුම්ගත කර තිබූ බව විගණනයේදී නිරීක්ෂණය විය. | ඇත. විගණනයේ පෙන්වාදී ඇති පරිදි එය සුදුසු නොවේ නම්, ඊළඟ වර්ෂයේ ඇස්තමේන්තු සකස් කිරීමේදී නිවැරදි කරන බව කාරුණිකව දන්වා සිටිමි. | |
| (ii) | මූල්‍ය ප්‍රකාශන අනුව, දිස්ත්‍රික් ලේකම් කාර්යාලයට අයත් නොවන වාහනවලට අදාල අළුත්වැඩියා කිරීම සඳහා දිස්ත්‍රික් ලේකම් කාර්යාලය හා වෙරුගල් ප්‍රාදේශීය ලේකම් කාර්යාලය විසින් රුපියල් 1,033,412 ක මුදලක් පිළිවෙළින් වාහන නඩත්තු වැය විෂය අංක 271-1-1-0-1301 හා 271-1-2-0-1301 යටතේ ගිණුම්ගත කර තිබුණි. එහි ප්‍රතිඵලයක් ලෙස වාහන නඩත්තු වියදම්, එම මුදලින් වැඩියෙන් දක්වා තිබුණි. | 2022 වසර තුලදී පැවැති දැඩි අයවැය වාතාවරණය නිසා, ඇතැම් වියදම් අඩු කිරීමට මෙම කාර්යාලයට ද උපදෙස් ලැබුණි. නමුත් අලුත්වැඩියාවන් සිදු කිරීමේ අත්‍යාවශ්‍ය බවත් ඇති වීම නිසා නඩත්තු වියදම් යටතේ අලුත්වැඩියා වියදම් සිදු කරන ලදි. | වැය ශීර්ෂ නිවැරදිව හඳුනා ගෙන ගිණුම් ගත කිරීම සිදු කළ යුතුය. |
| (iii) | ත්‍රිකුණාමලය දිස්ත්‍රික් ලේකම් කාර්යාලය වෙත වෙනත් අමාත්‍යාංශ/දෙපාර්තමේන්තු විසින් වියදම් කළ රුපියල් 1,168,488,299 ක වියදම මුදල් ප්‍රවාහ ප්‍රකාශයට ඇතුලත් කර නොතිබුණි. එම නිසා සමාලෝචිත වර්ෂය තුල ශුද්ධ මෙහෙයුම් මුදල් ප්‍රවාහය එම අගයෙන් අධිගණනය වී තිබුණි. | වටිනාකම රුපියල් 1,168,488,229 ක් වන වියදමක් විෂයට නවකයකු වූ අදාල නිලධාරියා විසින් මුදල් ප්‍රවාහ ප්‍රකාශයට ගෙන නොමැත. | අවසන් ගිණුම් කටයුතු සම්බන්ධ යෙන් විෂය භාර ජ්‍යේෂ්ඨ නිලධාරීන් විසින් වගකිව යුතුය. |

(ආ) මූලධන වියදම්

මූල්‍ය ප්‍රකාශනවලට අදාළ මූලධන වියදම් ගිණුම්ගත කිරීමේදී පහත සඳහන් අඩුපාඩු නිරීක්ෂණය විය.

| විගණන නිරීක්ෂණය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| CCTV කැමරා පද්ධතියක් සවි කිරීම සඳහා නගර හා කඩවත් ප්‍රාදේශීය ලේකම් කාර්යාලය විසින් ගෙවා තිබූ රුපියල් 300,000 ක මුදල හා නව සනීපාරක්ෂක ගොඩනැගිල්ලක් ඉදිකිරීම සඳහා කුච්චවෙලි ප්‍රාදේශීය ලේකම් කාර්යාලය විසින් ගෙවා තිබූ රුපියල් 1,000,000 ක මුදල පිළිවෙළින් යන්ත්‍ර හා | CCTV කැමරා පද්ධතියක් සවි කිරීම සම්බන්ධයෙන් වියදම් ගිණුම්ගත කිරීමේදී වැරදි ලෙස ගිණුම් ගත කර ඇත. ඒ බව දිස්ත්‍රික් ලේකම් කාර්යාලයේ හා නගර හා කඩවත් ප්‍රාදේශීය ලේකම් කාර්යාලයේ අදාල නිලධාරීන්ගේ අවධානයට යොමු කල අතර කුච්චවෙලි ප්‍රාදේශීය ලේකම් කාර්යාලයේ සනීපාරක්ෂක | වැය ශීර්ෂ නිවැරදිව හඳුනා ගෙන ගිණුම් ගත කිරීම සිදු කළ යුතුය. |

| | | |
|---|---|---|
| යන්ත්‍රෝපකරණවල මූලධන වත්කම් අත්පත් කර ගැනීමේ වැය විෂය අංක 271-1-2-0-2103 යටතට හා ගොඩනැගිලි හා ඉදිකිරීම්වල මූලධන වත්කම් අත්පත් කර ගැනීමේ වැය විෂය අංක 271-1-2-0-2104 යටතට ගිණුම්ගත නොකර මූලධන වත්කම් පුනරුත්ථාපනය හා වැඩි දියුණු කිරීමේ වැය විෂය අංක 271-1-1-0-2001 යටතේ ගිණුම්ගත කර තිබුණි. එහි ප්‍රතිඵලයක් වශයෙන් මූලධන වත්කම් පුනරුත්ථාපනය හා වැඩිදියුණු කිරීමේ වැය විෂය එම මුදල් ප්‍රමාණයෙන් වැඩියෙන් දක්වා තිබුණි. තවද එම වත්කම් මූල්‍ය නොවන වත්කම් යටතටද ගෙන නොතිබුණි. | ගොඩනැගිල්ල ඉදිකිරීමට අදාල වියදම් ගිණුම්ගත කිරීමේ දි වැරදි ලෙස ගිණුම්ගත කර ඇත. මෙවැනි ගැටළු ඉදිරියේදී සිදු නොවීමට වගබලා ගන්නා බව කාරුණිකව දන්වා සිටිමි. | |

(ඇ) බැරකම් හා බැඳීම්වලට එළඹීම

| | විගණන නිරීක්ෂණය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| | ----------------------- | ---------------------------- | ------------ |
| (i) | සේරුවිල ප්‍රාදේශීය ලේකම් කාර්යාලයේ 2022 වර්ෂයේ දී සේවාව සපයන ලද නමුත් ගෙවීම් සිදු නොකරන ලද වියදම්වලට අදාළව වගකීම් පිළිබඳව සිදු කරන ලද පරීක්ෂාව අනුව 2023 වර්ෂයේදී ගෙවීම් සිදුකර තිබූ එකතු වටිනාකම රුපියල් 1,488,305 ක් වූ වියදම් දිස්ත්‍රික් ලේකම් කාර්යාලයේ 2022 වර්ෂයේ මූල්‍ය ප්‍රකාශනවල බැඳීම් හා බැරකම් පිළිබඳ ප්‍රකාශය යටතේ දක්වා නොතිබුණි. | 2022 මූල්‍ය ප්‍රකාශනය සකස් කරන අවස්ථාව වන විට අදාල බැදීම අප වෙත වාර්තාව නොතිබූ බැවින් බැදීම් හා බැරකම් පිළිබඳ ප්‍රකාශය යටතේ සටහන් කර නොමැති බව කාරුණිකව දන්වා සිටින අතර එය මේ වන විට නිවැරදි කර යාවත්කාලීන කර ඇති බව කාරුණිකව දන්වා සිටිමි. | නිවැරදි තොරතුරු ගිණුම් ප්‍රකාශන වල ඉදිරිපත් කළ යුතුය. |
| (ii) | භාණ්ඩාගාර මුද්‍රිත (එස්ඒ 90) අනුව, බැරකම් සංචිතවල ආරම්භක ශේෂය රුපියල් 1,568,436,365 ක් වූ අතර සමාලෝචිත වර්ෂය තුල ශුද්ධ බැරකම් ප්‍රමාණය රුපියල් 2,361,972,444 ක් වීමෙන් බැරකම් සංචිතවල අවසාන ශේෂය රුපියල් 3,930,408,809 ක් විය. කෙසේ වුවද සමාලෝචිත වර්ෂයේ ශුද්ධ බැරකම් ප්‍රමාණය එස්ඒ 92 හි රුපියල් 334,016 ක් ලෙස පමණක් සඳහන් කර තිබුණු අතර 2022 වර්ෂයේ මූල්‍ය ප්‍රකාශනයේ ඇමුණුම iii හි සම්පූර්ණයෙන්ම පෙන්වා නොතිබුණි. | කින්නියා ප්‍රාදේශීය ලේකම් කාර්යාලය විසින් නව සිගාස් වෙබ් අතුරු මුහුණතේ බැරකම් වාර්තාව යාවත්කා ලීන කර නොතිබුණ අතර නිලධාරියා විසින් අතින් සකස් කළ බැරකම් වාර්තාව අනුව වැය ශීර්ෂ 271 යටතේ බැරකම් කිසිවක් නොමැති බව දක්වා තිබීම නිසා මෙම වෙනස ඇති වී ඇත. | සමාලෝචිත වර්ෂය අවසානය තෙක් යාවත්කාලීන කරන ලද තොරතුරු අවසන් ගිණුම් වලට ඇතුලත් කළ යුතුය. |

(ඇ) අග්‍රිම ශේෂය

අග්‍රිම ශේෂය ගිණුම්ගත කිරීමේදී පහත සඳහන් අඩුපාඩු අනාවරණය විය.

| | විගණන නිරීක්ෂණය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (i) | අග්‍රිම සාරාංශය අනුව (එස්ජ් 70) රුපියල් 42,182,404 ක මුදලක් අවසාන ශේෂය වශයෙන් පෙන්වනු ලැබුවත් 2022 වසර අවසාන අග්‍රිම පියවීම් රුපියල් 42,177,179 ක් විය. ඒ අනුව ඒසීඒ 3 පරිදි රුපියල් 5,225 ක වෙනසක් පැවතුණි. | අග්‍රිම සාරාංශය අනුව (එස්ජ් 70) රුපියල් 42,182,404 ක මුදලක් අවසාන ශේෂය වශයෙන් පෙන්වනු ලැබුවත් 2022 වසර අවසාන අග්‍රිම පියවීම් රුපියල් 42,177,179 ක් විය. ඒ අනුව ඒසීඒ 3 පරිදි රුපියල් 5,225 ක වෙනසක් පැවතුණි. | මූල්‍ය ප්‍රකාශනවල තොරතුරු නිවැරදිව ඉදිරිපත් කළ යුතුය. |
| (ii) | භාණ්ඩාගාර මුද්‍රිත පිටපත් අනුව අග්‍රිම ලැබීම් එස්ජ් 21 අනුව රුපියල් 2,311,949,476 ක් මුදලක් වුවද අග්‍රිම ගිණුම් ප්‍රකාශය (ඒසීඒ 3) අනුව එම ලැබීම් රුපියල් 2,324,514,983 ක් වීමෙන් එම අගයන් දෙක අතර රුපියල් 12,565,507 ක වෙනසක් නිරීක්ෂණය විය. | මෙහි නිවැරදිම වෙනස රුපියල් 29,616,897 ක් විය යුතුය. මෙම වෙනස එස්ජ් 21 (රුපියල් 2,354,131,880.88) සහ ඒසීඒ 3 රුපියල් 2,324,514,983.49 ක් අතර නොගැලපීම නිසා ඇති වූවකි. | මූල්‍ය ප්‍රකාශනවල තොරතුරු නිවැරදිව ඉදිරිපත් කළ යුතුය. |
| (iii) | අග්‍රිම ගිණුම් ප්‍රකාශය අනුව වෙනත් මූලාශ්‍රවලින් ලද අග්‍රිම, රුපියල් 413,035,983 ක් ලෙස සටහන් කර තිබුණද එය භාණ්ඩාගාර මුද්‍රිතයෙහි රුපියල් 442,652,880 ක් ලෙස සටහන්කර තිබීමෙන් එම අයිතම යටතේ රුපියල් 29,616,897 ක් වෙනසක් නිරීක්ෂණය විය. | 2022 වසර සඳහා අනෙකුත් මූලාශ්‍රවලින් ලද සත්‍ය අක්මුදල් රුපියල් 442,652,880 ක් වුවද අක්මුදල් ගිණුම් ප්‍රකාශයේ රුපියල් 413,035,983.49 ක් ලෙස වැරදියට නිරූපණය කර ඇත. | මූල්‍ය ප්‍රකාශනවල තොරතුරු නිවැරදිව ඉදිරිපත් කළ යුතුය. |

(ඉ) ලේඛන හා පොත්පත් පවත්වා නොතිබීම

ත්‍රිකුණාමලය දිස්ත්‍රික් ලේකම් කාර්යාලය හා ප්‍රාදේශීය ලේකම් කාර්යාල විසින් පහත දැක්වෙන ඇතැම් ලේඛන පවත්වා නොතිබුණු අතර, ඇතැම් ලේඛන විධිමත්ව හා යාවත්කාලීනව පවත්වා නොතිබුණු බව නියැදි විගණන පරීක්ෂණවලදී නිරීක්ෂණය විය.

| | විගණන නිරීක්ෂණය | | | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|---|---|
| (i) | ලේඛන වර්ගය | අදාළ රෙගුලාසිය | නිරීක්ෂණ | | |
| | භාණ්ඩ වට්ටෝරු ලේඛණය | | | | |
| | සේරුවිල, කන්තලේ හා මොරවැව ප්‍රාදේශීය ලේකම් කාර්යාල | මුදල් රෙගුලාසි 763 | යාවත්කාලීන කර නොතිබුණි. | විෂය නව නිලධාරියකු වෙත පවරූ අවස්ථාවලදී යාවත්කාලීන කිරීම යම් ප්‍රමාදයක් වී ඇත. එය නිවැරිදිව සිදු කිරීමට උපදෙස් ලබා දී ඇත. | නැවත නිලධාරීන් නිවැරදි පුහුණුවකින් අනතුරුව විෂය කටයුතු සඳහා අන්තර්ග්‍රහණය කළ යුතුය. |
| (ii) | ලේඛන වර්ගය | අදාළ රෙගුලාසිය | නිරීක්ෂණ | | |
| | ඇප ලේඛණය | | | | |
| | දිස්ත්‍රික් ලේකම් කාර්යාලය හා ප්‍රාදේශීය ලේකම් කාර්යාල 11 | මුදල් රෙගුලාසි 891 (1) | පවත්වාගෙන ගොස් නොතිබුණි. | ඇප ලේඛණය යාවත්කාලීන කිරීම ප්‍රමාදයක් සිදුව ඇති බව කාරුණිකව දන්වා සිටින අතරම ඉදිරියට පවත්වා ගැනීමට උපදෙස් දී ඇත. | මුදල් රෙගුලාසි 891 (1) ප්‍රකාරව කටයුතු කළ යුතුය. |

## 2. මූල්‍ය සමාලෝචනය

### 2.1 වියදම් කළමනාකරණය

වාර්ෂික අයවැය ඇස්තමේන්තු පිළියෙල කිරිම,ප්‍රතිපාදන මාරු කිරීම, පරිපූරක අයවැය ඇස්තමේන්තු මගින් ප්‍රතිපාදන ලබා ගැනීම හා උපයෝජනය හා ඉතිරිවීම් සම්බන්ධයෙන් අනාවරණය වූ විගණන නිරික්ෂණ පහත දැක්වේ.

| විගණන නිරික්ෂණය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
| --- | --- | --- |
| දිස්ත්‍රික් ලේකම් කාර්යාලය විසින් පුනරාවර්තන වියදම් විෂයයන් 7 ක් සඳහා වෙන්කර තිබූ එකතුව රුපියල් 44,600,000 ක් වූ ප්‍රතිපාදන වලින් මුදල් රෙගුලාසි 66/69 මාරු කිරීම් යටතේ එකතුව රුපියල් 9,250,000 ක මුදලක් මාරු කර තිබුණි. ඉන් පසුවද එයින් රුපියල් 7,883,036 ක ප්‍රතිපාදන ඉතිරි වී තිබීමෙන් රුපියල් 17,133,036 ක් අධි ප්‍රතිපාදනයක් ඇස්තමේන්තු ගත කර තිබුණි. | රටෙහි අර්බුදකාරී වාතාවරණය තුල කාර්යාල වැසීම, පරිපාලන කටයුතු සීමාවීම හා ව්‍යාපෘති බොහොමයක් අත්හිටුවීම නිසා ප්‍රතිපාදන ඉතිරි විය. | ප්‍රතිපාදන නිසි පරිදි සැලසුම් කළ යුතුය. |

### 2.2 වෙනත් අමාත්‍යාංශ හා දෙපාර්තමේන්තු විසින් ලබා දුන් ප්‍රතිපාදන උපයෝජනය

මේ සම්බන්ධයෙන් පහත විගණන නිරීක්ෂණ අනාවරණය විය.

| විගණන නිරික්ෂණය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
| --- | --- | --- |
| **එළුවන් ඇති කිරීමේ ව්‍යාපෘතිය - 2022** | | |
| (i) කෘෂිකර්ම අමාත්‍යාංශයේ ග්‍රාමීය ආර්ථික භෝග වගා හා ප්‍රවර්ධන අංශය මගින් ක්‍රියාත්මක කරනු ලබන පසුගාමී ග්‍රාමීය ප්‍රදේශවල ජීවත්වන ජනතාවගේ ජීවනෝපාය නගා සිටුවීම සඳහා ක්‍රියාත්මක උක්ත ව්‍යාපෘතිය යටතේ එළුවන් මිලදී ගැනීම සඳහා තාක්ෂණික ඇගයීම් කමිටු නිර්දේශවලට පටහැනිව අවුරුදු 2 ක් ඉක්මවූ එළුවන් 35 ක්, අවුරුදු 1 ½ ට අඩු එළුවන් 71 ක් ද, නිර්දේශිත බර ප්‍රමාණයන්ට ඉක්මවූ එළුවන් 12 ක් හා අවම බර ප්‍රමාණයට වඩා අඩු බරැති එළුවන් 49 ක් ද මිලදී ගෙන තිබීම හේතුවෙන් මෙම ව්‍යාපෘතියෙන් | වයස අවුරුදු 1 කට වැඩි එළුවන් 12 ක් හා කිලෝ ග්‍රෑම් 2.5 සිට 3.00 දක්වා බර ඇති එළුවන් 16 ක් ද මිලදී ගැනීම සිදු කර ඇත. වැඩි වයසින් යුතු සතුන් මිල දී ගැනීමක් සිදු කර නැත. මෙම එළුවන් ලබාගෙන ඇත්තේ ගැබ්ගෙන සිටීම නිසා ප්‍රතිලාභීන්ට අමතර ලාභයක් ලැබීමත්, නැගෙනහිර පළාත් සත්ත්ව නිෂ්පාදන හා සෞඛ්‍ය දෙපාර්තමේන්තු අධ්‍යක්ෂකගේ නිර්දේශය ලබා දී තිබීමත් හේතුවෙනි. | 2022 අගෝස්තු 26 දිනැති දිස්ත්‍රික් ලේකම් කාර්යාල තාක්ෂණික කමිටු වාර්තාව ප්‍රකාරව ප්‍රසම්පාදන කටයුතු සිදු කළ යුතුය. |

| | | | |
|---|---|---|---|
| | බලාපොරොත්තුවූ සත්ත්ව අභිප්‍රේරණය හා අඩු ආදායම්ලාභීන්ගේ ජීවනෝපාය වැඩි දියුණු කිරීමේ අරමුණු සාක්ෂාත් කර ගත නොහැකි විය. | | |
| (ii) | දිස්ත්‍රික් ලේකම් කාර්යාලයේ සැලසුම් අධ්‍යක්ෂකගේ අංක GAT/PLA/GRP /DO.09/2022 දරන 2022 නොවැම්බර් 12 දිනැති ලිපියෙන් මෙම ව්‍යාපෘතියට අදාලව ප්‍රතිලාභීන් තෝරා ගැනීමේදී ප්‍රතිලාභීන්ගෙන් මුදල් කිසිසේත් අවශ්‍ය නොවන බව සඳහන් කර තිබුණද, ගෝමරන්කඩවල, මොරවැව හා සේරුවිල ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශයේ ප්‍රතිලාභීන් 104 දෙනෙ කුට අදාළව රුපියල් 417,845 ක් ප්‍රතිලාභීන්ගෙන් අය කර ගෙන තිබුණි. | නිර්දේශිත නිර්ණායක අනුව අවශ්‍ය සතුන් සපයා ගැනීම දිගින් දිගටම අපහසු වීම නිසාත්, ලබා ගත හැකි මට්ටමේ සිටි ඇතැම් සතුන් සඳහා අමතර වියදමක් දැරිය යුතු වුව ද එම පිරිවැය ප්‍රතිලාභීන් විසින් ගෙවීමට ලිඛිතවම එකඟ වීම හා ව්‍යාපෘතිය නිම කිරීම කඩිනම් කිරීමට ඉල්ලීම නිසාත් එලෙස ක්‍රියාත්මක කර ඇත. | GAT/PLA/GRP/ DO.09/2022 දරන ලිපිය ප්‍රකාරව කටයුතු සිදු කළ යුතුය. |

**2.3 ප්‍රධාන ගණන්දීමේ නිලධාරී/ගණන්දීමේ නිලධාරී විසින් සිදු කළ යුතු සහතිකවීම්**

| විගණන නිරීක්ෂණය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 38 වන වගන්තියේ විධිවිධාන අනුව දිස්ත්‍රික් ලේකම් කාර්යාලයේ මූල්‍ය පාලනය සඳහා සඵලදායි අභ්‍යන්තර පාලන පද්ධතියක් සකස් කර පවත්වා ගෙන යනු ලබන බවට ගණන්දීමේ නිලධාරී සහතික විය යුතු අතර එම පද්ධතියේ සඵලදායිතාවය පිළිබඳව කලින් කල සමාලෝචනය සිදු කර ඒ අනුව පද්ධති ඵලදායි ලෙස කර ගෙන යෑමට අවශ්‍ය වෙනස්කම් සිදු කරනු ලැබිය යුතු බවත්, එම සමාලෝචනයන් ලිඛිතව සිදු කර එහි පිටපතක් විගණකාධිපති වෙත ඉදිරිපත් කළ යුතුව තිබුණත්, එවැනි සමාලෝචනයන් සිදු කළ බවට ප්‍රකාශ විගණනයට ඉදිරිපත් කර නොතිබුණි. | දිස්ත්‍රික් ලේකම් කාර්යාලයේ මූල්‍ය පාලනය සඳහා අභ්‍යන්තර පාලන පද්ධතියක් සකස් කර පවත්වා ගෙන යනු ලබන අතර එහි සමාලෝචනයන් සිදු කර තිබුණත්, ප්‍රමාදයක් නිසා අදාල විස්තර විගණනයට ඉදිරිපත් කිරීම මගහැරී ඇත. කඩිනමින් යොමු කිරීමට පියවර ගනු ඇත. | 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 38 වගන්තියේ විධිවිධාන ප්‍රකාරව කටයුතු කළ යුතුය. |

## 2.4 නීති, රීති හා රෙගුලාසිවලට අනුකූල නොවීම

නියැදි විගණන පරීක්ෂණවලදී නිරීක්ෂණය වූ නීති, රීති හා රෙගුලාසිවල විධිවිධානවලට අනුකූල නොවූ අවස්ථා පහත විග්‍රහ කර දැක්වේ.

| | නිරීක්ෂණය | | | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|---|---|
| | නීති,රීති හා රෙගුලාසි වලට යොමුව | වටිනාකම | අනුකූල නොවීම | | |
| | | රු. | | | |
| (i) | අංක 09/2009 හා 2009 අප්‍රේල් 16 දිනැති රාජ්‍ය පරිපාලන චක්‍රලේඛයේ 2 (iv) ඡේදය | 1,370,455 | අතිකාල හා නිවාඩු දින ගෙවීම් කිරීමේදී ඇඟිලි සළකුණු යන්ත්‍ර මඟින් තහවුරු කිරීම අත්‍යවශ්‍ය වුවත් දිස්ත්‍රික් ලේකම් කාර්යාලය, මොරවැව ප්‍රාදේශීය ලේකම් කාර්යාලය සහ තඹලගමුව ප්‍රාදේශීය ලේකම් කාර්යාලයේ නිළධාරීන් විසින් එලෙස කටයුතු නොකර සමාලෝචිත වර්ෂය තුලදී අතිකාල හා නිවාඩු දින දීමනා ලෙස ලබා ගෙන තිබුණි. | දිස්ත්‍රික් ලේකම් කාර්යාලයේ හා ප්‍රාදේශීය ලේකම් කාර්යාලවල ඇඟිලි සලකුණු යන්ත්‍ර ක්‍රියා විරහිත වීම නිසා පැමිණීමේ ලේඛනය අදාල මාණ්ඩලික නිලධාරියකුගේ සහතික කිරීම අතිකාල දීමනා හෝ නිවාඩු දින වැටුප් ගෙවා ඇත. | රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ අංක 09/2009 හි 2(iv) ඡේදය ප්‍රකාරව කටයුතු කළ යුතුය. |
| (ii) | මුදල් රෙගුලාසි 371(2)(ආ) වගන්තිය | 6,000,000 | නගර හා කඩවත් ප්‍රාදේශීය ලේකම් කාර්යාලය විසින් තත්කාර්ය අතුරු අග්‍රිම වශයෙන් දිස්ත්‍රික් ලේකම් කාර්යාලය වෙත 2022 සැප්තැම්බර් 13 වන දින, වී මිලදී ගැනීම් සඳහා ගෙවා තිබීම. | දිස්ත්‍රික් ලේකම් කාර්යාලයේ කළමනාකරණ කමිටුවේ සාකච්ඡාවකින් පසුව භාණ්ඩාගාරය සමඟ එකඟවී අත්තිකාරම් මුදලක් ලබාගෙන ඇත. අදාල මුදල් මේ වන විට සම්පූර්ණයෙන්ම පියවා ඇත. | මුදල් රෙගුලාසි 371(2)(ආ) වගන්තිය අනුව කටයුතු කළ යුතුය. |

## 3. මෙහෙයුම් සමාලෝචනය

### 3.1 සැලැසුම් කිරීම

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

| | විගණන නිරීක්ෂණය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) | ස්වදේශ කටයුතු අමාත්‍යාංශයේ ගිණුම් චක්‍රලේඛ අංක 02/2018 හා 2018 ජනවාරි 29 දිනැති චක්‍රලේඛය අනුව ප්‍රාදේශීය ලේකම් කාර්යාලය විසින් මහජනයා වෙත සපයන සේවා ප්‍රමුඛතා ගත කොට ප්‍රධාන සේවාවන් 5 කට අදාළව ප්‍රශස්ත ඉලක්කයන් තීරණය කර එම ඉලක්ක පිළිබඳ වාර්තාවක් දිස්ත්‍රික් ලේකම් කාර්යාලය වෙත ඉදිරිපත් කල යුතුය. දිස්ත්‍රික් ලේකම් කාර්යාලය විසින් එම චක්‍රලේඛයේ 2.5 හා 2.6 ඡේදයන්ට අනුව සියළුම ප්‍රාදේශීය ලේකම් කාර්යාලවල ප්‍රශස්ත ඉලක්කයන් සාරාංශගත කොට සකස් කරන ලද වාර්තාවක් විගණකාධිපතිටද පිටපත් සහිතව ස්වදේශ කටයුතු අමාත්‍යාංශය වෙත සෑම වර්ෂයකම ජනවාරි 15 වන දිනට පෙර ඉදිරිපත් කළ යුතු වුවත් ප්‍රාදේශීය ලේකම් කාර්යාල හා දිස්ත්‍රික් ලේකම් කාර්යාලය 2022 වර්ෂයට අදාළව එම වාර්තා ඉදිරිපත් කර නොතිබුණි. | ප්‍රාදේශීය ලේකම් කාර්යාලය විසින් මහජනයා වෙත සපයන සේවා ප්‍රමුඛතා ගත ප්‍රශස්ත ඉලක්කයන් තීරණය කර එම ඉලක්ක ඉටු කිරීම පිළිබඳ වාර්තා දිස්ත්‍රික් ලේකම් කාර්යාලය වෙත යොමු කර ඇතත් දිස්ත්‍රික් ලේකම් කාර්යාලය විසින් එම සියළුම ප්‍රාදේශීය ලේකම් කාර්යාලවල ඉලක්කයන් සාරාංශගත කොට සකසන ලද වාර්තාවක් විගණකාධිපතිටද පිටපත් සහිතව ස්වදේශ කටයුතු අමාත්‍යාංශය වෙත ඉදිරිපත් කර නොතිබූ බව කාරුණිව දන්වන අතරම එය කඩිනමින් යොමු කිරීමට පියවර ගන්නා බව ද කාරුණිව දන්වමි. | ස්වදේශ කටයුතු අමාත්‍යාංශයේ ගිණුම් චක්‍රලේඛ අංක 02/2018 හා 2018 ජනවාරි 29 දිනැති චක්‍රලේඛයේ 2.5 සහ 2.6 ඡේද අනුව කටයුතු කළ යුතුය. |
| (ආ) | මුදල් අමාත්‍යාංශ ලේකම්ගේ අංක MF/NPD/02/2021 හා 2021 දෙසැම්බර් 15 දිනැති චක්‍රලේඛයේ 3.1 වගන්තියට පටහැනිව ප්‍රාදේශීය ලේකම්ගේ අත්සන සහිතව දිස්ත්‍රික් ලේකම් කාර්යාලය වෙත යවන ලද සංවර්ධන යෝජනා සඳහා අනුමැතිය ලබාදී තිබුණේ ප්‍රාදේශීය ලේකම් කාර්යාලය විසින් ව්‍යාපෘති ක්‍රියාත්මක කිරීම සඳහා ගිවිසුම් ගතවී තිබූ දිනයට පසුව බව නිරීක්ෂණය විය. | මෙම ව්‍යාපෘති සඳහා ප්‍රාදේශීය සංවර්ධන කමිටු රැස්වීම්වලදී දිස්ත්‍රික් ලේකම්ගේ පූර්ව අනුමැතිය ලබාදී තිබුණි. පසුව දිස්ත්‍රික් ලේකම් වෙත යොමු කළ ඇතැම් ලේඛන වල දින වකවානු හා ව්‍යාපෘති ක්‍රියාත්මක කිරීම සඳහා ගිවිසුම් ගතවී තිබූ දින අතර පරස්පරතාවක් ඇති බව නිරීක්ෂණය වේ. | දිස්ත්‍රික්කය තුල ක්‍රියාත්මක කරනු ලබන සියළුම ව්‍යාපෘති දිස්ත්‍රික් ලේකම්ගේ අනුමැතිය ලද පසු ක්‍රියාත්මක කළ යුතුය. |

### 3.2 කාර්යභාරයන් ඉටු නොකිරීම

පහත සඳහන් නිරීක්ෂණය කරනු ලැබේ.

| විගණන නිරීක්ෂණය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
| --- | --- | --- |
| ආර්ථික පුනර්ජීවනය හා දරිද්‍රතාවය තුරන් කිරීම සඳහා වන ජනාධිපති කාර්ය සාධන බලකායේ අග්‍රාමාත්‍ය අතිරේක ලේකම්ගේ අංක PTF/01/1BP/2022/RDP හා 2021 දෙසැම්බර් 09 දිනැති ලිපියේ 2 වගන්තිය අනුව කෘෂිකාර්මික, පශු, ධීවර හා වැවිලි යනාදී ක්ෂේත්‍රවල ව්‍යාපෘති යෙදවුම් සඳහා ඉහළ ඉල්ලුමක් ලබන වසර තුළ ඇති වන බැවින් ඒවා සැපයීමේ හැකියාව අදාළ ආයතනවලින්/ අමාත්‍යාංශවලින් විමසා තහවුරු කරගෙන ව්‍යාපෘති සංඛ්‍යාව හා ව්‍යාපෘතියේ ධාරිතාවය තීරණය කළ යුතු වුවද, සේරුවිල ප්‍රාදේශීය ලේකම් කාර්යාලය මඟින් ජීවනෝපාය සංවර්ධන ව්‍යාපෘතිය යටතේ ක්‍රියාත්මක කර තිබූ රුපියල් මිලියන 3 වැඩසටහනෙහි සත්ත්ව පාලනයට අදාලව ප්‍රතිලාභීන් 75 ක් සඳහා එකතු වටිනාකම රුපියල් 7,110,000 ක් වූ ව්‍යාපෘති ක්‍රියාත්මක කර නොතිබුණි. | අදාළ ව්‍යාපෘතිය අනුව සත්ව පාලන ව්‍යාපෘති වලට තෝරාගත් ප්‍රතිලාභීන්ට සතුන් ලබා දිමට දිස්ත්‍රික් ලේකම් කාර්යාලයෙන් මිල ගණන් කැඳවා තිබුණ ද මිල ගණන් නොලැබීම නිසා සතුන් සැපයීමට නොහැකි වූ බව කාරුණිකව දන්වා සිටිමි. | ව්‍යාපෘතියට අදාල චක්‍රලේඛ මත පදනම්ව කටයුතු කළ යුතුය. |

### 3.3 අපේක්ෂිත නිමවුම් මට්ටම ලබා නොගැනීම

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

| විගණන නිරීක්ෂණය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
| --- | --- | --- |
| (අ) සේරුවිල ප්‍රාදේශීය ලේකම් කාර්යාලය යටතේ ක්‍රියාත්මක ගම සමඟ පිළිසඳරක් වැඩසටහනෙහි සෝමපුර ප්‍රාථමික විද්‍යාලයේ වහල ප්‍රතිසංස්කරණය කිරීම සම්බන්ධයෙන් 2022 ඔක්තෝබර් 06 දින සිදු කරන ලද ක්ෂේත්‍ර පරීක්ෂාවේදී එම වහලයේ මුදුන් වහලයට යොදා තිබූ | අදාළ ගොඩනැගිල්ලේ මුදුන් ඇස්බැස්ටෝස් තහඩු ගැලවී ඇති බව විදුහල්පති විසින් සේරුවිල ප්‍රාදේශිය ලේකම් කාර්යාලය වෙත වාර්තා කර නොතිබූ අතර පසුව මේ පිළිබඳව පරීක්ෂා | ව්‍යාපෘතිවල අපේක්ෂිත නිමවුම් මට්ටම එලෙසින්ම ලබා කර ගැනීමට කටයුතු සිදු කළ යුතුය. |

| | | | |
|---|---|---|---|
| | ඇස්බැස්ටෝස් අඩි 6 ක ප්‍රමාණයක් තැන් 2 කින් ගැලවී ගොස් තිබූ බැවින් ඒ සඳහා තාවකාලිකව මුදුන් උළු යොදා තිබුණි. වහළ ප්‍රතිසංස්කරණය කර මාසයක් ගතවීමට පෙර එහි වහළ ගැලවී ගොස් තිබුණද විගණන දින වන විට එම ගොඩනැගිල්ල වැඩ අවසන් කර භාර දී මාස 7 ක් පමණ ගතවී තිබූ නමුත් එම අඩුපාඩු නිවැරදි කර නොතිබුණි. ඒ හේතුවෙන් ප්‍රාථමික අංශයේ ශිෂ්‍ය ශිෂ්‍යාවන් 75 ක් පමණ ඉගෙනුම ලබන ප්‍රාථමික ගොඩනැගිල්ල වැසි කාලයේදී තෙමීමට ලක් වීම හා මුදුන් උළු පන්ති කාමර තුලට වැටිය හැකි වීම වැනි අනාරක්ෂිත තත්ත්වයක පැවතුණි. | කිරීමෙන් පසු රඳවුම් මුදල් ගෙවීමට පෙර එය නිවැරදි කිරීමට උපදෙස් ලබා දී ඇත. | |
| (ආ) | යුද්ධයෙන් අවතැන් වූ මහජනතාවට ස්ථිර නිවාස සකස් කර දීමේ වැඩසටහන යටතේ වෘත්තීය පුහුණු හා නිපුනතා සංවර්ධන සහ යෞවන කටයුතු අමාත්‍යාංශයේ ලේකම්ගේ අංක PH/NECA/2019-1 දරන හා 2019 ජනවාරි 12 දිනැති ලිපියේ 4.4 වගන්තිය අනුව කුච්චවේලි ප්‍රාදේශීය ලේකම් කාර්යාලය විසින් නිවාස 05 ක් ඉදිකිරීම සඳහා ප්‍රතිලාභීන් පස්දෙනකුගේ බැංකු ගිණුමට රුපියල් මිලියන 4.98 බැගින් මුදල් නිදහස් කර තිබුණි. නිවාස ඉදිකිරීම සඳහා ප්‍රතිපාදන ලබාදී වසර 3 කට වඩා වැඩියෙන් ගතවී තිබුණද ප්‍රතිලාභීන්ගේ නිවාස සම්පූර්ණයෙන්ම ඉදිකර නොතිබීම හේතුවෙන් මෙම නිවාස පදිංචි වීමට නුසුදුසු තත්ත්වයෙන් පැවතුණි. | ව්‍යාපෘතියට අදාලව අවසන් ගෙවීම 2021 දෙසැම්බර් මස ප්‍රතිලාභීන්ගේ සමෘද්ධි බැංකු ගිණුමට බැර කර ඇත. ප්‍රතිලාභීන්ගේ එක් එක් වැඩ කටයුතු අවසන් වූ බව තහවුරු වූ පසු ඊළග ගෙවීම් කිරීමට සමෘද්ධි බැංකුවෙන් තැන්පත් කර ඇත. වැඩ නිමා කිරීම අනුව ගෙවීම් වවුචර් මගින් මුදල් මුදාහැර ඇත. ප්‍රතිලාභීන්ගේ වැඩ අවසන් කිරීම ප්‍රමාද කිරීම නිසා අවසන් ගෙවීමට තිබූ මුදල් බැංකුවල තබා ගෙන ඇත. | ව්‍යාපෘතිය කඩිනමින් නිම කිරීමට ප්‍රතිලාභීන් උනන්දු කල යුතු අතර අදාල මුදල් කඩිනමින් නිදහස් කළ යුතුය. |

## 3.4 අපේක්ෂිත ප්‍රතිලාභ (Outcome) ලබා නොගැනීම

පහත සඳහන් නිරීක්ෂණය කරනු ලැබේ.

| විගණන නිරීක්ෂණය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| කින්නියා ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශයේ ඇති මුනෙච්චේනයි ග්‍රාම නිලධාරී වසමේ කුතුස් අදිපර් මාර්ගය හා එහි කාණු පද්ධතිය සකස් කිරීම සඳහා මිලියන 3 හා මිලියන 4 ව්‍යාපෘති යෝජනා යටතේ මුළු ප්‍රතිපාදනය වශයෙන් රුපියල් මිලියන 1.6 ක් වෙන්කර තිබූ අතර 2022 මාර්තු 30 දින ගිවිසුම්කරුවන් වෙත රුපියල් 1,386,000 ක් ගෙවීම් කර ව්‍යාපෘතිය නිම කර තිබුණි. නමුත් විගණන ක්ෂේත්‍ර පරීක්ෂාවේදී මෙම කාණු පද්ධතිය තුල ජලය එක් රැස් වී ඇති අතර කාණුවලට පිටුපසින් වැලි නොදැමීම නිසා වලවල් සෑදී අවිධිමත්ව නිමකර ඇති බවක් දක්නට ලැබුණි. | මෙම ව්‍යාපෘතිය වර්ෂාව අධික කාලයක නිමකර ඇත. පසුව අදාල පිරවීම් සිදු කර ජලය රැස්වීම මගහරවා ගෙන ඇත. කාණුව අවසානයේ පුද්ගලික ඉඩමක් පිහිටා තිබීම නිසා යම් ගැටළුවත් මතු වුවද අවසාන ගෙවීම් සිදු කිරීමට ප්‍රථම අඩුපාඩු නිවැරදි කිරීමට උපදෙස් දී ඇත. | ව්‍යාපෘති වල ප්‍රතිපාදන ප්‍රශස්ථව භාවිතා කළ යුතුය. |

## 3.5 ව්‍යාපෘති නිම නොකර අත්හැර දැමීම

පහත සඳහන් නිරීක්ෂණය කරනු ලැබේ.

| විගණන නිරීක්ෂණය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| ග්‍රාමීය මාර්ග සහ යටිතල පහසුකම් යෝජනා ක්‍රමය - 2021 යටතේ මහා මාර්ග අමාත්‍යාංශ ලේකම්ගේ අංක SMRR/PL/01/CIR/AM දරන 2021 ඔක්තෝබර්18 දිනැති ලිපිය සහ 2021 නොවැම්බර් 22 දිනැති අමතර යටිතල පහසුකම් කැබිනට් අමාත්‍යාංශයේ සැලසුම් අධ්‍යක්ෂකගේ ලිපියට අදාලව සියළුම ග්‍රාමීය මාර්ග සංවර්ධන වැඩසටහන් 2021 දෙසැම්බර් 15 දිනට පෙර නිමකල යුතු වුවත්, කින්නියා ප්‍රාදේශීය ලේකම් කාර්යාලය විසින් අදාල ව්‍යාපෘතිය යටතේ මාර්ග ඉදිකිරීම් ව්‍යාපෘතීන් 17 කට මුළු එකතුව වශයෙන් රුපියල් මිලියන 26 ක ප්‍රතිපාදන වෙන්කර එයින් රුපියල් මිලියන | යටිතල පහසුකම් කැබිනට් අමාත්‍යාංශයේ සැලසුම් අධ්‍යක්ෂකගේ ලිපියට අදාලව සියළුම ග්‍රාමීය මාර්ග සංවර්ධන වැඩසටහන් 2021 දෙසැම්බර් 15 දිනට පෙර නිමකල යුතු බවට දන්වා තිබුණත් අග්‍රීම ලැබීම අනුව රුපියල් මිලියන 3.57 ක මුදලක් ගිවිසුම්කරුවන් වෙත ගෙවා ඇත. අග්‍රීම ප්‍රමාදවීම නිසා ව්‍යාපෘති නිම කිරීම 2021 දෙසැම්බර් 15 දිනට පෙර කළ නොහැකි වුවද පසුව එම ව්‍යාපෘති නිම කර ඇත. අග්‍රීම නොලැබීම් නිසා ගෙවීම් නිමකිරීම නිම කර නැත. | ව්‍යාපෘති නිසි පරිදි සැලසුම් කර ක්‍රියාත්මක කළ යුතුය. |

3.57 ක මුදලක් පමණක් ගිවිසුම්කරුවන් වෙත ගෙවා තිබුණි. මේ හේතුවෙන් සමාලෝචිත වර්ෂය අවසන් වන විටත් මෙම ව්‍යාපෘතින් 17 ම අත්හරින ලද තත්ත්වයේ දක්නට ලැබුණි.

## 3.6 ප්‍රසම්පාදනයන්

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

| | විගණන නිරීක්ෂණය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) | සේරුවිල ප්‍රාදේශීය ලේකම් කාර්යාලය විසින් 2022 වසරේ සිදු කල ප්‍රසම්පාදන අවස්ථා 8 කදී සැපයුම්කරුවන් විසින් ඉදිරිපත් කල මිල, වලංගු කාලය ඉක්මවා මිලදී ගැනීම් සිදු කිරීම හේතුවෙන් එකතුව රුපියල් 799,870 ක් අදාල සැපයුම්කරුවන් වෙත පළමු එකඟතාවයේ සඳහන් මිල ගණන් වලට වඩා වැඩියෙන් ගෙවා තිබුණි. | අදාළ ප්‍රසම්පාදන කටයුතු දිස්ත්‍රික් ලේකම් කාර්යාලය විසින් සිදු කළ අතර අයිතමයන් මිලදී ගන්නා අවස්ථාවේදි වෙළඳපොලේ භාණ්ඩ මිල සීඝ්‍රයෙන් ඉහළ ගොස් තිබුණි. මේ හේතුව නිසා ප්‍රතිලාභීන්ට තම ව්‍යාපෘතින් ආරම්භ කිරිමට නොහැකි වි ඇත. | රජයේ ප්‍රසම්පාදන මාර්ගෝපදේශ සංග්‍රහයේ උපදෙස් ප්‍රකාරව කටයුතු කළ යුතුය. |
| (ආ) | ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ප්‍රසම්පාදන මාර්ගෝපදේශ සංග්‍රහයේ 7.12.1 වගන්තිය අනුව එලදායි තරඟකාරී බවක් නොමැති බව පැහැදිලිව පෙනෙන විට, ඒ අනුව ලැබුණ සියළුම ලංසු ප්‍රතික්ෂේප කරනු ලැබිය හැකිය හා තරඟකාරී බවක් නොමැති බව ලද ලංසු සංඛ්‍යාව මත පමණක් තීරණය නොකළ යුතු බව දක්වා තිබුණි. 2022 වර්ෂයේදී කන්තලේ ප්‍රාදේශීය ලේකම් කාර්යාලය විසින් ප්‍රසම්පාදන සිදු කිරීමේදී ආයතන එකකින් පමණක් මිල ගණන් ඉදිරිපත් කර තිබියදී එම මිල ගණන් ඉදිරිපත් කල ආයතනය මඟින්ම මිලදී ගැනීම් සිදු කර තිබූ අවස්ථා 10 ක් පැවති අතර එහි එකතු වටිනාකම රුපියල් 1,098,968 ක් විය. තවද ප්‍රසම්පාදන මාර්ගෝපදේශ සංග්‍රහයේ | 2022 වසර තුල පැවැති ආර්ථික අවපාතය, ඩොලරයෙහි රුපියල් අනුපාතය ඉහළයාම හා ආනයන සීමා කිරීම නිසාත් ප්‍රසම්පාදන කටයුතු සිදු කිරීමේදී භාණ්ඩ හෝ සේවා සඳහා මිල ගණන් කැඳවන අවස්ථාවලදී එක් ආයතනයකින් හෝ දෙකකින් පමණක් මිල ගණන් ඉදිරිපත් කර තිබුණු අතර තෝරාගත් සැපයුම්කරුවන් වෙත ඇණවුම් ලබාදුන් විට දී භාණ්ඩ සැපයීම තොග නැති බව හෝ නොහැකි බව ප්‍රකාශ කිරීම නිසා 2022 වර්ෂයේදී ප්‍රසම්පාදන සිදු කිරීමේදී ආයතන කිහිපයකින් පමණක් අවස්ථා කිහිපයකදී මිලදී ගැනීම් සිදු කිරීමට සිදු | රජයේ ප්‍රසම්පාදන මාර්ගෝපදේශ සංග්‍රහයේ උපදෙස් ප්‍රකාරව කටයුතු කළ යුතුය. |

| | | |
|---|---|---|
| 7.12.2(අ) වගන්තිය අනුව පුළුල් ප්‍රචාරයක් ලබා දීමෙන් පසුව ලංසු එකක් පමණක් ලැබුණද වෙළඳපල වටිනාකම් අනුව සැසඳීමේදී සඳහන් කර ඇති ලංසු මිල සාධාරණ නම්, ලංසු කැඳවීමේ ක්‍රියාවලිය වලංගු බවට සලකනු ලැබිය හැකි බවට දක්වා තිබුණද එසේ වෙළඳපල වටිනාකම් අනුව සැසඳීම් කර ලංසුකරු තීරණය කර තිබූ බවට තොරතුරු අදාල ලිපි ගොනු වල දක්නට නොලැබුණි. | විය. පැවැති වාතාවරණය අනුව එම මිල දී ගැනීම් ප්‍රශස්ථ නොවන බවත් අපගේ පාලනයෙන් තොර බාහිර සාධක මත එවැනි තත්තවයටක් ඇති වූ බවත් කාරුණිකව දන්වා සිටිමි. | |

## 3.7 වත්කම් කළමනාකරණය

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

| | විගණන නිරීක්ෂණය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| | ----------------------- | ---------------------------------- | ------------ |
| (අ) | මුදල් රෙගුලාසි 342 (1) අනුව උප පත්‍රිකා පොත් ලබාගන්නා දෙපාර්තමේන්තු එම පොත් සුරක්ෂිත භාරයේ තබා ගැනීමත් ඒවා නිසි පරිදි පරිහරණය කිරීමත් යන වගකිව යුතු බව දක්වා තිබුණද කන්තලේ ප්‍රාදේශීය ලේකම් කාර්යාලයේ AB 70 ශ්‍රී ලංකා රජයේ නිවාඩු දුම්රිය බලපත්‍ර නම් වූ උපපත්රිකා පොතක් හා සත්ත්ව ප්‍රවාහන උපලේඛණ 1 නම් වූ උප පත්‍රිකා පොත් 2 ක් අස්ථානගතව පැවතුණි. | AB 70 ශ්‍රී ලංකා රජයේ නිවාඩු දුම්රිය බලපත්‍ර නම් වූ උපපත්‍රිකා පොත අස්ථානගත වූ බවට දන්වා ඇතත් මෙම පොත මේ වනවිටත් භාවිතා කරමින් පවතී. විගණන විමසුම් සිදු කරන ලද දිනයේදී මෙම පොත විෂයභාර නිලධාරී විසින් අත්සන් තබා භාර ගෙන නොතිබූ නමුත් එය භාවිතා කරමින් තිබූ අතර මේ වන විට එම නිලධාරිනියගෙන් භාර ගත් බවට අත්සන යොදා අදාල ලේඛනය නිවැරදි කර ගෙන ඇති බව කාරුණිකව වාර්තා කරමි. සත්ව ප්‍රවාහන උප ලේඛන අංක 01 උපප්‍රතිකා පොත් 02 ක් ආපසු භාරදුන් බවට එවකට විෂයභාර නිලධාරිනිය එම පිටුවෙහිම සටහනක් තබා ඇත. ඉදිරියේදී මෙවැනි අඩුපාඩු සිදු නොවීමට වගකීමෙන් කටයුතු කරන ලෙස ගබඩා භාර නිලධාරියා දැනුවත් කරන ලදී. | මුදල් රෙගුලාසි 342 (1) අනුව කටයුතු කළ යුතුයි. |

| | | | |
|---|---|---|---|
| (ආ) | මුදල් අමාත්‍යාංශ ලේකම්ගේ 2018 ඔක්තෝම්බර් 10 දිනැති අංක 03/2018 දරන රජයේ මූල්‍ය නොවන වත්කම් කළමනාකරණය - රජයට අයත් වාහනවල ලියාපදිංචි අයිතිය පිළිබඳ ගැටළු නිරාකරණය කිරීම මැයෙන් වූ චක්‍රලේඛය අනුව වාහනවල ලියාපදිංචි අයිතිය තමා සතු නොවන වාහන සම්බන්ධයෙන් ලියාපදිංචි අයිතිය නිරවුල් කරගත යුතු වුවත් දිස්ත්‍රික් ලේකම් කාර්යාලය හා ප්‍රාදේශීය ලේකම් කාර්යාල 11 විසින් තමා සතු වාහන 56 ක ලියාපදිංචි අයිතිය එසේ නිරවුල් කර නොගත් අවස්ථා පැවතිණි. | වාහනවල මුල් පිටපත පවතින අවස්ථාවලදී පවරා ගැනීමේ කටයුතු සිදු කළ හැකිය. එසේ නොමැතිවිට වාහනය හිමි වත්මන් ආයතනය විමසා ලියාපදිංචි මුල් පිටපත ඔවුන් සන්තකයේ පවතින බවට තහවුරු කරගත යුතුව ඇත. එසේ මුල් පිටපත් පිළිබඳව ගැටළු ඇති අවස්ථාවලදී අනුපිටපත් 39 ත් ලබා ගැනීමට කටයුතු කර ඇත. එමෙන්ම මේ වන විට වාහන 02ක්, ට්‍රැක්ටර් රථ 15ක සහ ට්‍රේලර් 15ක අයිතිය විධිමත්කර ලැබී ඇති අතර, සෙසු වාහනවල අයිතිය විධිමත් කිරීම සඳහා භාර දී තිබූ නමුත් මෙතෙක් ලැබී නොමැත. | මුදල් අමාත්‍යාංශ ලේකම්ගේ 2018 ඔක්තෝම්බර් 10 දිනැති අංක 03/2018 දරන චක්‍රලේඛය ප්‍රකාරව කටයුතු කළ යුතුය. |
| (ඇ) | මුදල් අමාත්‍යාංශ ලේකම්ගේ 2018 ඔක්තෝබර් 10 දිනැති අංක 03/2018 දරන චක්‍රලේඛයේ 03 වන වගන්තියට අනුව ගර්හිත වාහන හෝ අබලි වාහන ලෙස අපහරණය කිරීමට නියමිත වාහන වල නිත්‍යානුකූල අයිතිය පිළිබඳව ගැටළු පවතින අවස්ථාවලදී එවැනි වාහන අපහරණය කිරීමට පෙර එහි දැක්වූ ක්‍රියාවලිය අනුගමනය කරමින් අදාළ ආයතනය විසින් ලියාපදිංචි අයිතිය ලබා ගත යුතු අතර ඒ සමගම එම වාහනයේ ලියාපදිංචිය අවලංගු කිරීමේ ක්‍රියාවලියද සිදුකළ යුතු බවට දක්වා තිබුණද දිස්ත්‍රික් ලේකම් කාර්යාලය හා ප්‍රාදේශීය ලේකම් කාර්යාල විසින් මෙම කාර්යය සිදු කර නොතිබීමෙන් දිස්ත්‍රික් ලේකම් කාර්යාලය විසින් අපහරණය කළ යුතු ලෙස හඳුනාගත් මෝටර් සයිකල් 21ක් ද මුතුර් ප්‍රාදේශීය ලේකම් කාර්යාලය විසින් අපහරණය කළ යුතු ලෙස හඳුනාගත් මෝටර් සයිකල් 06 ක්ද වාහන අපහරණ කටයුතු සිදු කර නොතිබුණි. | පවරා ගැනීමේ ක්‍රමවේදය අනුව එම කටයුතු නිම වූ වහාම සඳහන් කර ඇති යතුරුපැදි අපහරණය කිරීමට කටයුතු සිදු කරන බව කාරුණිකව දන්වා සිටිමි. | මුදල් අමාත්‍යාංශ ලේකම්ගේ 2018 ඔක්තෝම්බර් 10 දිනැති අංක 03/2018 දරන චක්‍රලේඛය ප්‍රකාරව කටයුතු කළ යුතුය. |

## 3.8 පාඩු හා හානි

පහත සඳහන් නිරීක්ෂණය කරනු ලැබේ.

| විගණන නිරීක්ෂණය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
| --- | --- | --- |
| මුදල් රෙගුලාසි 110(2) අනුව ගණන්දීමේ නිලධාරියා විසින් සෑම මුදල් වර්ෂයකදීම වැය ශීර්ෂයක එක් එක් වැඩසටහන සම්බන්ධව සිදු වූ හානි පිළිබඳ ප්‍රකාශයක් වෙන වෙනම පිළියෙල කල යුතු වුවත් දිස්ත්‍රික් ලේකම් කාර්යාලයට අදාල මූල්‍ය ප්‍රකාශනවල කටයුතු අවසන් නොවූ එකතු වටිනාකම රුපියල් 4,910,566 ක් වූ වාහන අනතුරු සම්බන්ධයෙන් ඇතිවූ අලාභ පිළිබඳව තොරතුරු ඉදිරිපත් කර නොතිබුණි. | වාහන අනතුරු සම්බන්ධයෙන් ඇතිවූ අලාභ පොතෙන් කපා හැරීම සම්බන්ධ විස්තර පිළිබඳව තොරතුරු 2022 මූල්‍ය ප්‍රකාශනයේ 53 පිටුවෙහි සඳහන් කර ඇත. එමෙන්ම වාහන අනතුරු සම්බන්ධයෙන් පාඩු හා හානි වාර්තා සම්පූර්ණ කර නොමැති විස්තර ඇතුලත් කර නොමැති බව කාරුණිකව දන්වමි. | මුදල් රෙගුලාසි 110(2) අනුව කටයුතු කළ යුතුය. |

## 3.9 කළමනාකරණ දූර්වලතා

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

| | විගණන නිරීක්ෂණය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
| --- | --- | --- | --- |
| (අ) | සමාලෝචිත වර්ෂයට අදාළව දිස්ත්‍රික් ලේකම් කාර්යාලය යටතේ පවතින ප්‍රාදේශීය ලේකම් කාර්යාල බල ප්‍රදේශයේ සිටින දරිද්‍රතාවයෙන් පෙලෙන ජනගහනය 31,698 ක් වුවද සමෘද්ධි සහනාධාර වාර්තාව අනුව සමෘද්ධි ලබාගත් සමෘද්ධි ලාභීන් සංඛ්‍යාව 59,023 ක් වීම විගණනයේදී ගැටළු සහගත විය. තවද සමෘද්ධි ප්‍රතිලාභ වලට හිමිකම් නොලබන පුද්ගලයින් 27,325 ක් වෙනුවෙන් රුපියල් මිලියන 1,049.7 ක් සමාලෝචිත වර්ෂයේදී ගෙවා තිබූ බව නිරීක්ෂණය විය. | නිවැරදි ආදායම් තොරතුරු නොලැබීම් හෝ නිලධාරීන්ගේ අතපසුවීම් නිසා හිමිකම් නොලබන පුද්ගලයින්ද ප්‍රතිලාභීන් බවට පත්වීමට ඉඩ ඇත. මේ සම්බන්ධව අවධානය යොමු කරන ලෙස දිස්ත්‍රික් සමෘද්ධි අධ්‍යකෂ හා ප්‍රාදේශීය ලේකම්වරුන් දැනුවත් කර ඇත. | වියදම් වාර්තා නිවැරදිව ඉදිරිපත් කිරීමට කටයුතු කළ යුතුය. |

| | | | |
|---|---|---|---|
| (ආ) | පාලෙලෙතෝපුර්, මූතූර් බටහිර, තඹලගමුව, කන්තලේ නගරය සහ හාතියගම සමෘද්ධි බැංකුවල සමාලෝචිත වර්ෂය අවසාන වන විට මූල්‍ය ප්‍රකාශන අනුව කල් ඉකුත් වූ ණය එකතුව රුපියල් මිලියන 214.79 ක් හිඟහිටව පැවතුණි. | එම මුළු මුදලින් 51% ක ප්‍රමාණයක් මේ වන විට අයකර ගෙන ඇත. ඉතිරි 49% ක ප්‍රමාණය අයකර ගැනීම සම්බන්ධව දිස්ත්‍රික් සමෘද්ධි අධ්‍යක්ෂ සමඟ සාකච්ඡා කර අවශ්‍ය පියවර ගන්නා බව කාරුණිකව දන්වා සිටිමි. | අදාල ණය මුදල් කඩිනමින් අයකර ගැනීමට කටයුතු කළ යුතුය. |
| (ඇ) | කින්නියා ප්‍රාදේශීය ලේකම් කාර්යාලයට අයත් සමෘද්ධි බැංකු 3 ක පවතින අවිනිශ්චිත ගිණුම්වල එකතුව රුපියල් මිලියන 177.61 ක හර ශේෂයක් පැවතුණි. මෙම ශේෂය ඇති වීමට බලපෑ වූ කරුණු හඳුනා ගෙන ඒවා ගැලපීම් කිරීමට මේ දක්වා කටයුතු කර නොතිබුණි. | කින්නියා ප්‍රාදේශීය ලේකම් කාර්යාලයට අයත් සමෘද්ධි බැංකු 3 ක පවතින අවිනිශ්චිත ගිණුම්වල පවතින හර ශේෂ රුපියල් මිලියන 177.61 ක තිබීමට අදාල කරුණු හඳුනා ගෙන කඩිනමින් ගැලපීම් කිරීමට උපදෙස් ලබා දී ඇත. | අදාල ගැලපීම් කඩිනමින් සිදු කළ යුතුය. |
| (ඈ) | තඹලගමුව, හාතියගම හා කන්තලේ නගරය යන සමෘද්ධි බැංකු වල සමෘද්ධි ඉතිරිකිරීම් සහිත ප්‍රතිලාභීන් 254 කට අයත් රුපියල් 30,000 ක් ඉක්මවූ එකතුව රුපියල් මිලියන 14.33 ක මුදල් සමෘද්ධි බැංකුවේ ඉතිරි කිරීම් ලෙස ඉතා දීර්ඝ කාලයක සිට තිබීයදීත් එය නොසළකා හැර ඔවුන් වෙත මාසික සමෘද්ධි සහනාධාර ලබා දී තිබුණි. | සමෘද්ධි ප්‍රතිලාභීන්ගේ ඉතිරිකිරීමේ ගිණුම්වලට මාසික සමෘද්ධි සහනාධාර මුදල් මෙන්ම සමාජ ආරක්ෂණ ප්‍රතිලාභී මුදල් ද බැර වන අතර මේ පිළිබඳව පරීක්ෂා කර බලා ඔවුන්ගේ ගිණුම්වල මාසික සහනාධාර මුදල් පමණක් රු. 30,000/- ට වැඩියෙන් පවතින ප්‍රතිලාභීන්ගේ මාසික සමෘද්ධි සහනාධාර අත්හිටුවීමට උපදෙස් දී ඇත. | ප්‍රතිලාභය අත්‍යවශ්‍ය පුද්ගලයන් සඳහා පමණක් සහනාධාරය ලබා දිය යුතුය. |
| (ඉ) | සමෘද්ධි සංවර්ධන දෙපාර්තමේන්තුවේ අංක DSD/Ho/05/MF/01/චක්‍රලේඛ දරන සහ 2022 මැයි 26 දිනැති චක්‍රලේඛයේ 5.4 ඡේදය අනුව විශේෂ ආධාර මුදල් එක් එක් පුද්ගලයාගේ ඉතිරි කිරීමේ ගිණුම්වලට බැර කළ පසු, ලබාගත් අරමුදල් ගිණුමේ ශේෂයක් නොතිබිය යුතුය. තවද ශේෂයක් ඇත්නම් එම මුදල් ලබා දිය යුතු පුද්ගලයන් සොයා ඔවුන්ගේ | සමෘද්ධි බැංකු විසින් කාණ්ඩ අංක 4062 යටතේ ලෝක බැංකු ආධාර, ආසියානු සංවර්ධන බැංකු ආධාර යටතේ ලබා දුන් සහනාධාර මුදල් ශේෂයක් ඇත්නම් එම මුදල් ලබා දිය යුතු පුද්ගලයන් සොයා ඔවුන්ගේ ගිණුම්වලට කඩිනමින් බැර කිරීමට උපදෙස් ලබා දී ඇත. | සමෘද්ධි සංවර්ධන දෙපාර්තමේන්තුවේ අංක DSD/Ho/05 /MF/01/චක්‍රලේඛයේ 5.4 ඡේදය අනුව කටයුතු කළ යුතුය. |

| | | | |
|---|---|---|---|
| | ගිණුම්වලට බැර කළ යුතු වුවත් කින්නියා හා කන්තලේ ප්‍රාදේශීය ලේකම් කාර්යාල යටතේ ඇති සමෘද්ධි බැංකු විසින් කාණ්ඩ අංක 4062 යටතේ ලෝක බැංකු ආධාර, ආසියානු සංවර්ධන බැංකු ආධාර යටතේ ලබා දුන් සහනාධාර මුදල් එකතුව රුපියල් මිලියන 14.09 ක මුදලක් සමාලෝචිත වර්ෂය අවසන් වන විටත් පවත්වාගෙන ගොස් තිබුණි. | | |
| (ඊ) | සමෘද්ධි සංවර්ධන දෙපාර්තමේන්තුවේ අධ්‍යක්ෂ ජනරාල්වරයාගේ 2022 මාර්තු 02 දිනැති අංක DSD/HO/SW/14/19/01/Circular දරන සමෘද්ධි සහනාධාර ක්‍රියාත්මක කිරීම පිළිබඳ චක්‍රලේඛය අනුව 2022 අප්‍රේල් මාසයේ සිට සමෘද්ධි ප්‍රතිලාභීන්ට ලබාදෙන ගෙවීම්වල සිදුවන වැඩිවීම් සඳහා ක්‍රියාමාර්ග ගැනීම නැවත දැනුම් දෙනතුරු අත්හිටුවිය යුතු බවට සඳහන් කර තිබුණි. එසේ වුවද කින්නියා ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශයේ සිටින ප්‍රතිලාභීන්ට සමෘද්ධි මාසික දීමනා අළුතින් ලබා දී තිබූ අතර මෙහි ප්‍රතිඵලයක් ලෙස එකතුව රුපියල් 661,000 ක් සමෘද්ධි මාසික දීමනා 2022 අප්‍රේල් මාසයෙන් පසුවත් ප්‍රතිලාභීන් 25 කට ලබාදෙමින් පැවතුණි. | කින්නියා ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශයේ සමෘද්ධි මාසික දීමනා අළුතින් ලබා දීමේදී සමෘද්ධි සංවර්ධන දෙපාර්තමේන්තුවේ අධ්‍යක්ෂ ජනරාල්වරයාගේ 2022 මාර්තු 02 දිනැති අංක DSD/HO/SW/14/19/01/ Circular දරන සමෘද්ධි සහනාධාර ක්‍රියාත්මක කිරීම පිළිබඳ චක්‍රලේඛය පිළිබඳව අවබෝධයෙන් තොරව කටයුතු කර තිබූ අතර ලබාදෙමින් පැවැති ප්‍රතිලාභ සුදුසු පරිදි අත්හිටුවීමටත් මින් පසුව අදාල චක්‍රලේඛ පරිදි කටයුතු කරන ලෙසත් උපදෙස් දී ඇත. | සමෘද්ධි සංවර්ධන දෙපාර්තමේන්තුවේ අධ්‍යක්ෂ ජනරාල්වරයාගේ 2022 මාර්තු 02 දිනැති අංක DSD/HO/SW/14/ 19/01/Circular අනුව කටයුතු කළ යුතුය. |
| (උ) | මොරවැව ප්‍රාදේශීය ලේකම් කාර්යාලය සතු නිල නිවාස 3 ක් විධිමත් ආකාරයෙන් නිල නිවාස වල පදිංචිකරුවන් වෙත පවරා දී නොතිබුණු අතර ඒ සම්බන්ධයෙන් වාර්තා හා ලිපි ලේඛන පවත්වාගෙන ගොස් නොතිබුණි. | රජයේ නිල නිවාස සම්බන්ධව අදාල පරිපාටික ක්‍රමය අනුගමනය කර අදාල නිලධාරීන්ට භාරදීමටත්, ලිපිගොනු නිසිආකාරව ගොනු කරනු කිරීමටත් උපදෙස් දී ඇත. | අදාල ලිපි ලේඛණ නිසි ආකාරයෙන් පවත්වා ගත යුතුය. |

## 4. තිරසර සංවර්ධන අරමුණු ළඟා කර ගැනීම

පහත සඳහන් නිරීක්ෂණය කරනු ලැබේ.

| විගණන නිරීක්ෂණය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
| --- | --- | --- |
| තිරසාර ඉලක්කයන් පිළිබඳ නිලධාරින් ප්‍රමාණවත් පරිදි දැනුවත් වී නොතිබුණු අතර තිරසාර සංවර්ධන ඉලක්කයන් හඳුනා ගැනීම සිදුවී නොමැති නිසා සමාලෝචිත වර්ෂයේ ඉලක්කයන් සපුරා ගැනීම පිළිබඳ ඇගයීමක් කිරීමට නොහැකි විය. | දිස්ත්‍රික් ලේකම් කාර්යාලය හා ප්‍රාදේශිය ලේකම් කාර්යාලය විසින් ඉදිරියේදී සැලසුම් සකස් කිරීමේදී දිස්ත්‍රික්කයේ තිරසාර සංවර්ධන ප්‍රමුඛතා හඳුනා ගෙන කටයුතු කරන ලෙස උපදෙස් දී ඇත. | තිරසාර සංවර්ධන ඉලක්කයන් හඳුනා ගැනිමට හා ක්‍රියාත්මක කිරිමට කටයුතු කළ යුතුය. |

## 5. මානව සම්පත් කළමනාකරණය

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

| | විගණන නිරීක්ෂණය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
| --- | --- | --- | --- |
| (අ) | සමාලෝචිත වර්ෂය අවසාන වන විට ජ්‍යෙෂ්ඨ මට්ටමට අයත් නිළධාරි තනතුරු පුරප්පාඩු 13ක් ද තෘතික මට්ටමට අයත් නිළධාරි තනතුරු පුරප්පාඩු 29 ක්ද ද්විතික මට්ටමට අයත් නිළධාරි තනතුරු පුරප්පාඩු 47 ක් හා ප්‍රාථමික මට්ටමට අයත් නිළධාරි තනතුරු පුරප්පාඩු 43 ක්ද වශයෙන් මුළු පුරප්පාඩු ප්‍රමාණය 132 ක් විය. එහිදී ප්‍රාදේශීය ලේකම් කාර්යාල 9 ක ද්විතියික මට්ටමට අයත් නිළධාරීන් 70 දෙනෙකුගේ පුරප්පාඩු පැවති නමුත් දිස්ත්‍රික් ලේකම් කාර්යාලය සහ ප්‍රාදේශීය ලේකම් කාර්යාල 3 ක ද්විතියික මට්ටමේ නිළධාරීන් 25 දෙනෙකු අතිරික්තව පැවතුණි. මෙම පුරප්පාඩු සමතුලනය කල යුතුව පවති. | මෙම දිස්ත්‍රික් ලේකම් කාර්යාලයේ හා ප්‍රාදේශීය ලේකම් කාර්යාලවල පවතින තනතුරු පුරප්පාඩු සම්පූර්ණ කරන ලෙසට අමාත්‍යාංශය දැනුවත් කර තිබේ. | අත්‍යවශ්‍ය තනතුරු පුරප්පාඩු පිරවිමට වහා අවධානය යොමුකර ඒවා පිරවිමට කටයුතු කළ යුතුය . |

| | | | |
|---|---|---|---|
| (ආ) | දිස්ත්‍රික් ලේකම් කාර්යාලයේ සහ ප්‍රාදේශීය ලේකම් කාර්යාලවල සේවා කාලය වර්ෂ 05 ක් ඉක්මවා සිටින නිලධාරීන් සම්බන්ධයෙන් ස්ථාන මාරු ප්‍රතිපත්තියක් ක්‍රියාත්මක කර නොතිබීම නිසා නගරයෙන් දුර බැහැර ප්‍රාදේශීය ලේකම් කාර්යාලවල දීර්ඝ කාලයක සිට ස්ථාන මාරු අපේක්ෂාවෙන් සිටින නිලධාරීන්ට අසාධාරණයක් සිදු වී තිබුණි. | අභ්‍යන්තර ස්ථාන මාරු ප්‍රතිපත්තියක් සකසා විධිමත් පරිදි එය රාජ්‍ය සේවා කොමිෂන් සභාව මගින් අනුමතකර ස්ථාන මාරු ක්‍රියාත්මක කිරීමට පියවර ගන්නා ලද නමුත්, එම ස්ථාන මාරු ප්‍රතිපත්තිය සඳහා අමාත්‍යාංශය ලේකම්ගේ අනුමැතිය නොලැබීම හේතුවෙන් ක්‍රියාත්මක කිරීම අවහිරවිය. | 2001 අගෝස්තු 22 දිනැති අංක 18/2001 දරන රාජ්‍ය පරිපාලන චක්‍රලේඛය ප්‍රකාරව කටයුතු කළ යුතුය. |